1 වන පිටුවෙන්.....

# ඉන්දියාවේ 'ලොකු අයියා' පාට් එක!

එවිට පුරුදු පරිදි ඒ පළාත්වල සිටින පරණ එල්ටීටීඊ කාරයින්ට සන්ධානයට මුවාවී ඇවිත් ආසන දිනා යළිත් උතුරු නැගෙණහිර පමණක් නොව මුළු ශ්‍රීලංකාවේම එකම දෙමළ ජනතා නියෝජිතයින් ලෙස ස්ථාවර වන්නට හැකියාව ලැබේ.

ඉන්දියාව එක්සත් ශ්‍රීලංකාවක් සඳහා කටයුතු කරනවායයි කියන ගමන් යටිකූට්ටු ලෙස ඊළම්වාදී ද්‍රවිඩ සංන්ධානයට වක්‍රව උදව්කරන බව පැහැදිලිවම පෙනේ. අපට ඔවුන් එසේ නීති රීති පණවමින් අප බයකරන්නේ ඊළම් බෙදුම්වාදීන්ට ඉන් සහනයක් සළසන්නටය. ඉන්දියාව කිසි-සේත් විශ්වාස කළයුතු රටක් නොවේ.

## බළලා මල්ලෙන් එළියට පනී

ශ්‍රීලංකා ජනාධිපතිවරයා සමග කළ සාකච්ඡාව අවසාන හරියේදී ශිව ශංකර් මෙනන් ඉන්දියාවේ තමිල් නාඩුව නිසා ඉන්දීය රජයට මුහුණපාන්නට සිදුව ඇති බැරෑරුම් තත්වයක්ද රාජපක්‍ෂ ජනාධිපති වරයාට දැන්වූයේය. ඒ මෙයයි.

එය ඉන්දියාවටද වන යහපතක් ලෙස දැන් ඉන්දියානු රජය දකී. තමිල් නාඩුව නළවාතැබීම ඒ එක ප්‍රයත්නයකි. එහෙත් ඉන්දියාව එසේ කරන්නට යන්නේ ලංකාව නිකම් ඔවුන්ගේ වැඩකාර කොල්ලෙක් ගණනට ගෙන " මං කියන විදියට තෝ මේක කරපිය " යන විලාශයෙනි. ඉන්දියා-වට එසේ අපට හයිපාට් දාන්නට අප කිසි-සේත් ඉඩ දිය යුතු නැත. එය අපේ රජය වටහාගනු ඇතැයි සිතමු.

## දෙමළ ඩයස්පෝරාව දැන් රඟපාන භූමිකාව

දෙමළ ඩයස්පෝරාව ලෝකය පුරා සංවිධාන කටයුතු අරඹා ඇත. දෙමළ ඊළමක් තැනීමේ කාර්‍යය ප්‍රභාකරන්ගේ මරණයෙන් නැවතුණු තැන සිට වර්තමාන දෙමළ තරුණපෙළ කරටගත යුතුයයි කියමින් ඔවුන් වෙබ්අඩවි මගින් හා පුවත්පත් මාධ්‍යයෙන් ප්‍රචාරය කර හරිති. ඒ අනුව ලොව පුරා සංවිධාන කටයුතු අරඹා ඇත. බ්‍රිතාන්‍යය කැනඩාව ප්‍රංශය හා ස්වීඩනය යන රටවල සිටින ද්‍රවිඩයෝ ඊට අවශ්‍ය මුදල් සැපයීමේ නිරතව සිටිති. ඒ මුදල් සෙවීම හොඳින් හෝ නරකින් හෝ කිරීමට ඔවුන් කටයුතු යොදා ඇත. ඊළම් පාපන්දු කණ්ඩායමක් හා ඊළම් ක්‍රිකට් කණ්ඩායමක් දැනට තනාගෙන ඇත. ඊළම් පාපන්දු කණ්ඩායම කුර්දිස්ථාන්වලට පාපන්දු තරඟයක් සඳහා යන ඡායාරූප වෙබ් අඩවි වල පළකර ඇත.

මුදල් යොදවා බටහිර මාධ්‍යවේදීන් ලවා ප්‍රචාරය ගෙන එමගින් බටහිර රටවල පනවා ඇති ඊළම් තහනම් ඉවත්කරවා ගැනීම ඔවුන්ගේ අරමුණයි. එය නුදුරු කාලයේ සිදුවනු ඇතැයි දෙමළ ඩයස්පෝරාව සිතයි. කරුණානිධි හා ජයලලිතා ඇතුළු තමිල් නාඩුවේ අය ඊළම් සිහිනය සැබෑවක් කරන්නට කටයුතුකරන්නේ ඒ දෙමළ ඩයස් පෝරාව ගැන විශ්වාසය තබා ය.

♦ සංජය



**කරුණානිධි Karunanidhi**

දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ ඩී. එම්. කේ. හෙවත් ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ව්‍යාපාරයේ නායක කරුණානිධි අගෝස්තු මාසයේ වල්ලිපුරම් හි දෙමළ ඊළාම් පාක්ෂිකයින් ගේ සමුළුවක් (Tamil Eelam Supporters Conference (TESC) පැවැත්වීමට නායකත්වය දෙමින් සිටී. ඒ සමුළුවේ සභාපතිවරයාද ඔහුය.

කරුණානිධිගේ පුතා වන ස්ටාලින් ඩී. එම්. කේ. පක්ෂයේ භාණ්ඩාගාරිකය. එසේම ඔහු මෙම ඊළම් සමුළුව සඳහා පත්කර ඇති ප්‍රධාන පෙළේ දෙමළ නීතිඥවරුන්ගෙන් සැදුම්ලත් කොමිටියේ ප්‍රධානියාද වෙයි. 1986 දී මදුරෙයි හිදී පැවැත්වූ ඊළම් සමුළුව ගිය මගම යමින් මෙවර ජාත්‍යන්තර වශයෙන් දෙමළ ඊළම පිහිටුවීමට සහයෝගය දක්වන විදේශිකයින්ගේද උදව් ඇතිව මහ ඉහළින් එය පවත්වන්නට කටයුතු සියල්ල සූදානම් කර ඇත.

කෙසේ වුවද මෙම වැඩපිළිවෙල ඉන්දියානු මහ රජයේ අයට හිතට අල්ලා නැත. පිටරටින් සපෝටර්ලා එහි පැමිණ ඉන්දියාවේ ඊළම් පිහිටුවීමක් ගැන ඉන්දීය භූමියේ දී කතාකරනවාට ඉන්දියා රජය කෙහෙත්ම කැමතිවන්නේ නැත. අප කවුරුත් දැන සිටින ඉතිහාසය පරිදි ඉන්දියාවේ දක්ෂිණ භාගයේ සිට ඊළමක් පතා කරන කෑගැසීම අර්ථවත් කරන්නේ ලංකාවේ ඊළමක් ගැන නොව දකුණු ඉන්දියාවම කැඩී වෙනම රාජ්‍යයක් ලෙස වෙන්වන්නටය. මේ තත්වය ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුව දනී. ඔවුන් බියට පත්ව ඇත්තේ ඒ නිසාය.

ඒ ඊළම් සමුළුවට ඉඩදිය යුතුද? නැද්ද? ඉඩ දෙනවා නම් කොපමණ ප්‍රමාණයකින්ද යන්න දැන් ඉන්දියානු රජයට තීරණය කරගන්නට බැරි තත්වයක්ව ඇත. එය ඇවිලී ගියහොත් මුස්ලිම් පන්ජාබ් ආදී අවුල් සේම හෝ ඊටත් වඩා සමස්ථ ඉන්දියාවම මහා පරිමාණයේ තවත් මහා අවුලක වැටෙනවා නියතය.

මෙනන් ලංකාවට දුවගෙන ආවේ ඒ නිසාය. ලංකාවේ උතුරු නැගෙණහිර කිසියම් සහනකාරී තත්වයක් ඇති වුව-


# මැකෝලේගේ ලංකා දරුවෝ

**වකුල ගුණපාල විසිනි by Wakula Gunapala**

**මැ**කෝලේ සාමිවරයා (Lord Macaulay) ඉපදුනේ 1800 දී එංගලන්තයේ ලෙස්ටර් ප්‍රාන්තයේ ස්කොට්ලන්ත ප්‍රභවයට අයත් වංශවත් පවුලකය. ඔහුගේ සම්පූර්ණ නම තෝමස් බැබින්ටන් මැකෝලේය. හාර්ට්ෆර්ඩ්ෂයර් හි පාසැලක මූලික ඉගෙනුම ලබා ඔහු කේම්බ්‍රිජ් සරසවියේ ට්‍රිනිටි විදුහලට උසස් අධ්‍යාපනය සඳහා ඇතුල්ව නීතිය හැදෑරීය. දීප්තිමත් ශිෂ්‍යයෙකු වුවද ඔහු නීතිය වෘත්තිය කොට නොගෙන දේශපාලනයට පිවි-සෙන්නට අදහස් කළේය. 1833 දී කේන් නමැති ප්‍රදේශයයේ ආසනය සඳහා ඔහු තේරීපත්වූයේය. කේන් පළාත දැන් හඳුන්වන්නේ ලීඩ්ස් යන නමිනි. එසේම ඔහු බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ පාලක කමිටුවේ ලේකම්වරයා වශයෙන්ද කටුයුතු කළේය.

එය 18 වන සිය වසේ මුල් භාගයයි. වික්ටෝරියා මහ රැජිණගේ පාලන සමයයි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය පැතිරී යමින් තිබූ අවධියයි. ඉංග්‍රීසීන් විසින්ම පිහිටුවන ලද නැගෙණහිර ඉන්දියා වෙළඳ සමාගම ( British East India Corporation) ඉන්දියානු අර්ධ කලාපය පුරා වර්ෂ 1700 පටන් ඉතා ප්‍රබලව ක්‍රියාත්මක වූ අතර එයට පූර්ණ බ්‍රිතාන්‍ය රාජකීය අනුග්‍රහයද ලැබී තිබුණේය. එම බ්‍රිතාන්‍ය නැගෙණහිර ඉන්දියා වෙළඳ සමාගමට තිබුණේ විශාල බලයකි. ඔව්හු ඉන්දියාව ඇතුළු ඒ ඉසව්වේ රටවල වෙළඳ කටයුතු ඇතුළු සියළු කටයුතු පාලනය කරන තත්වයක් ඇතිකර ගෙන සිටියහ. ඔවුනට වෙනම විශේෂ හමුදාවක්ද තිබුණේය. ඔවුන් කටයුතු කළේ තමනට රිසි පරිදිය. මේ තත්වය බ්‍රිතාන්‍ය රාජ්‍යයේ එතරම් මනාපයට හේතු නොවීය. ඒ නිසා රජය කළේ වෙළඳ සමාගමේ කටයුතු ගැන සොයා බලා ක්‍රමවත් කරන්නට ආණ්ඩුකාරයෙකු සමග පරිපාලන මණ්ඩලයක්ද ඉන්දියාවට පත්කර හැරීමයි. ඔවුන්ගේ කාර්‍යය වූයේ ඉන්දියාවේ සිදුවන දේ පිළිබඳව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව දැනුම්වත් කිරීමයි.

1834 දී මැකෝලේ ඉන්දියාවට යවන ලද්දේය. 34-1938 දක්වා ඔහු ඉන්දියාවේ උත්තරීතර පාලනමණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සේවය



**Lord Macaulay (Thomas Babington Macaulay) British poet, historian and politician. 1800 -1859**

කළේය. එකල නැගෙණහිර ඉන්දියා වෙළඳ සමාගමේ පරිපාලනයේදී හින්දි සංස්කෘත හා පර්සියානු අරාබි භාෂාවන් භාවිතා වූයේය. බ්‍රිතාන්‍ය පාලනයට පෙර එහි පැවති ඉන්දියානු මහාරාජා සහ මෝගල් රජ සමයේද පාලන භාෂාවන් වූයේ ඒවාය. ඉන්දියාවේ පාසැල් වල ද ඒ භාෂාවන් වලින් පමණක් ඉගැන්වීම් කළ අතර, ඒ පාසැල් නඩත්තු වූයේ නැගෙණහිර ඉන්දියා වෙළඳ සමාගමේ මුදල් වලිනි. වෙළඳ සමාගම ඒ පිළිවෙල ඒ අයුරින්ම යන්නට හැරියේ ඔවුන්ට ඒ නිසා තම පාලනයට කරදරයක් නොවූ බැවිනි.

## යටත් විජිත රටවල් සඳහා මැකෝලේ ඉදිරිපත් කළ සුප්‍රකට අධ්‍යාපන න්‍යාය පත්‍රය

එය බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ ශක්තිමත් ලෙස පය ගසාගන්නට වෑයම්කරමින් සිටි කාලයයි. බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාගේ පාලක කමිටුවේ සාමාජිකයෙකු ලෙස මැකෝලේ ඉන්දියාවේ අධ්‍යාපනය කෙබඳු විය යුතුදැයි සැලැස්මක් පිළියෙල කර 1935 දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට එව්වේය. ඔහු පෙන්නාදුන්නේ ඉන්දියාවේ පාසැල්වලට ඉංග්‍රීසි අධ්‍යාපනය දිය යුතු බවය. එය මතු කලක ඉන්දියානු වැසියන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ පාලනයේ ගැත්තන් බවට පත්කරගැනීමේ මූලික අඩිතාලම බවය. එම ලියවිල්ලේ මැකෝලි සංස්කෘත සහ පර්සියානු භාෂාවල් හඳුන්වා තිබුණේ අවමානයට ලක්කරමිනි. එම භාෂා ඉතා හීනන, එමෙන්ම රළු, වැදගැම්මකට නැති බව ඔහු සඳහන් කළේය. සංස්කෘත හා පර්සියානු භාෂාවලින් ලැබිය හැකි දැනුම ඉංග්‍රීසිවල අහලකින්වත් තබන්නට බැරි යයි ද ඔහු කියා ඇත. හාස්‍යජනක කාරණය නම් ඉංග්‍රීසිය සමග සසඳන විට ඔහු ඒ භාරත භාෂාවන්ගේ එක ද අකුරක්වත් වචනයක්වත් දැන නොසිටීමයි.

ඉන්දියාවේ ඉංග්‍රීසි අනුකාරක ඉන්දියානුන්ගෙන් සමන්විත පිරිසක් ගොඩනැගීමේ අවශ්‍යතාව මැකෝලි අවධාරණය කළේය. එම පිරිසට බ්‍රිතාන්‍ය රාජ්‍ය නිලධාරීන් හා සාමාන්‍ය ඉංග්‍රීසි නොදන්නා ඉන්දියානු ජනතාව අතර අතරමැදි තෝල්කයන් ලෙස කටයුතු කළ හැකි බවද ඔහු පෙන්වා දුන්නේය. ඒ පිරිස හමෙන්, පැහැයෙන් හා ලේවලින් ඉන්දියානුවන් වන නමුත් ඇතුළතින් සුදු මානසිකත්වයකින් ද ඉංග්‍රීසි සිරිත් විරිත් අනුගමනය කරන වහල් පිරිසක් වනු ඇති බවද මැකෝලි පෙන්නා දුන්නේය. බ්‍රිතාන්‍ය ගැති කලු සුද්දන්ගේ සමාජයක් ඉන්දියාවේත් ලංකාවේත් බිහිවන්නට ඒ මූලික අත්තිවාරම දැමූයේ මැකෝලි ඉංග්‍රීසි බස යටත් විජිතයන්හි අධ්‍යාපනයට හැරවීමෙනි.

අධ්‍යාපනය පිළිබඳ මෙම අධිරාජ්‍යවාදී මතය සහ ක්‍රමය වඩාත් ප්‍රයෝජනයට ගන්නා ලද්දේ ක්‍රිස්තියානු සහ කතෝලික මිෂනාරිවරුන් විසිනි. එම අනුබලය මත ඔව්හු අතිශය උනන්දුවෙන් බ්‍රිතාන්‍යයේ සියළු යටත් විජිතයන් කරා ගොස් ක්‍රිස්තියානි පාසැල් ආරම්භ කළහ. එසේම එය ඒ ඒ රටවල කිතු දහම පැතිර වීම සහ ඒ රටවල වැසියන් ආගමට හරවා ගැන්මට පහසුවක් විය.

මැකෝලේගේ අදහස් හා උපදෙස් පිළිගත් බ්‍රිතාන්‍ය රජය ඒ අනුව ක්‍රිකාත්මක වූහ. ඉතා ඉක්මනින් ඉංග්‍රීසිය ඉන්දියාවේ නිල භාෂාව මෙන්ම එරටේ

5 වන පිටුවට →



## How the cat came out of the bag

As the Sinhala article explained here, about ten days ago India's National Security advisor **Shiv Shankar Menon** made a sudden hush hush trip to Sri Lanka, one Friday evening for two days as reported by our newspapers. Menon, as some might be able to recollect was Indian High commissioner in Sri Lanka some time ago. Now he is the National Security advisor in India - a post of Cabinet rank.

He met the Prsident over breakfast next morning and with Gothabaya Rajapaksa. the defence Secretary.

Almost at the end of his his conversation with the President, Menon also appraised him of the compulsions the Govt. in New Delhi is facing from political parties in the Southern State of Tamil Nadu. Already the D.M.K. leader Karunanidhi is giving leadership to a **Tamil Eelam Supporters Conference** (TESC) to be held in Vallipuram in August with Karunanidhi as chairman of the conference. His son Stalin who is the treasurer of the DMKis the head of the reception committee consisting of prominant Eelaam activists, lawyers and politicians etc. They want to hold it on the lines of the last one held in Madurai in 1986.

Besides inviting national leaders, they propose to invite international leaders supporting the Eelaam cause. It is doubtful whether India would tolerate international leaders coming and talking on the Eelaam cause in Indian soil. As we know from its history, the cry of Eelaam from India's southern states would imply a cry for separatism of Southern States too. That is an issue the Centre in India is highly sensitive about.

Of course these Eelaamists would also make a big hue and cry about the Eelaam issue in Sri Lanka too. India must be concerned about how far they should tolerate such a conference on its soil, groups including international participation using its soil to promote division in a neighbouring country. These seem to be more urgent issues which brought Menon to Sri Lanka.

For us the hue and cry for Eelaam is something we are used to (kammale inna ballata hena gehuwata gananak nethilu ! As the saying goes that - The dog in the village smithy is undaunted by sounds of lightening ) But for India a new cry for Eelaam in their South would have many repercussions for their new international role and status. That is why they must be more jittery.

♦ Sanjaya W.